සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

## අවසාන වාර පරීක්ෂණය - 2025
## இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

| ශ්‍රේණිය தரம் Grade | 11 | ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - I, II | කාලය நேரம் Time | පැය 03යි |
|---|---|---|---|---|

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

**අතිරේක කියවීම් කාලය : මිනිත්තු 10**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (×) ලකුණ යොදන්න.**

1. ජාත්‍යන්තර මුහුදු සීමාව හා අනන්‍ය ආර්ථික කලාපයක් නොමැති ප්‍රදේශයක් පිහිටා ඇත්තේ, ශ්‍රී ලංකාවට
   1. වයඹ දිශාවෙනි. 2. දකුණු දිශාවෙනි.
   3. නැගෙනහිර දිශාවෙනි. 4. උතුරු දිශාවෙනි.

2. සාමුද්‍රිකව වාසය කරන කාර්තිලේජීය මත්ස්‍යයෙකු වන්නේ,
   1. කොප්පරා 2. තෝරා 3. මඩුවා 4. බලයා

3. නිවසට ගෙන ආ මත්ස්‍යයෙකු කුමන ජල ස්ථරයේ වෙසෙන්නෙකු ද යන බව එම මත්ස්‍යා නිරීක්ෂණය කළ ශිෂ්‍යයෙකු පැවසුවේය. මෙම නිගමනයට එළඹීමට හේතු වූ මත්ස්‍යයාගේ ශරීර කොටස මින් කුමක් ද?
   1. ඇස් 2. මුඛය 3. වරල් 4. අංශ රේඛාව

4. ජීවයේ පැවැත්ම සඳහා ආහාර දාමයක වඩාත් වැදගත් වන පෝෂණ මට්ටමට අයත් වන්නේ,
   1. කුඩා මසුන් 2. විශාල මසුන්
   3. සත්ත්ව ප්ලවාංග 4. ශාක ප්ලවාංග

5. ජලජ පරිසරයක දක්නට ලැබෙන ජීව-අජීව අන්තර් ක්‍රියාවකට නිදසුනකි.
   1. සහභෝජිත්වය 2. ප්‍රභාසංස්ලේෂණය
   3. පරපෝෂිතතාවය 4. සහජීවනය

6. කිවුල් දිය ඉස්සන්ට ජීවත්විය හැකි ප්‍රශස්ත ලවණතාවය මින් කුමක් ද?
   1. 0 ppt 2. 15 ppt 3. 40 ppt 4. 50 ppt

7. ශ්‍රී ලංකාවේ විශාලතම ස්වාභාවික වරාය පිහිටා ඇත්තේ,
   1 .ත්‍රිකුණාමලය 2. ගාල්ල 3. කොළඹ 4. කල්පිටිය

Past Papers Wiki





8. වියළි කලාප වල පිහිටා ඇති කාලීන ජලාශයක ජීවත් වන ජීවින්ට වඩාත්ම බලපාන ස්වාභාවික ආපදාව වන්නේ,
1. ජල ගැලීම් 2. නියඟය 3. සුළි සුලං 4. පාංශු ඛාදනය

9. අඩු පිරිවැයකින් පහසුවෙන්ම ඇති කළ හැකි විසිතුරු මත්ස්‍ය විශේෂය කුමක් ද?
1. ගෝල්ඩ් ෆිෂ් 2. ඩිස්කස් 3. ප්ලේටි 4. ෆයිටර්

10. මසුන් ඇල්ලීමට යොදා ගන්නා අක්‍රිය ආම්පන්නයකි.
1. විසි දැල 2. මා දැල 3. අතංගුව 4. කරමල් දැල

11. ජලජ පරිසර පද්ධතිවල ජෛව විවිධත්වය කෙරෙහි බලපාන රසායනික සාධකයකි.
1. ආවිලතාවය 2. pH අගය 3. උෂ්ණත්වය 4. උත්කූපායනය

12. පහත දැක්වෙන්නේ ඒකක ක්ෂේත්‍රඵලයක සිටින මත්ස්‍ය ගහන ඝනත්වය නිරූපණය කෙරෙන රූප සටහන් හතරකි.(තිත් මගින් මත්ස්‍යයන් නිරූපණය කෙරේ.) එම රූප සටහන් අතරින් සූක්ෂම වගා පද්ධතියක් නිරූපණය කෙරෙන පිළිතුර තෝරන්න.


1. 
2. 
3. 
4. 

13. බහුදින ධීවර යාත්‍රා සඳහා පතුලේ ගැඹුර සොයා ගැනීමට වැදගත් වන උපකරණය මින් කුමක් ද?
1. ප්‍රතිධ්වනිමානය. 2. සෝනා උපකරණය
3. මත්ස්‍ය නිරීක්ෂණ උපකරණ 4. ලෝක ව්‍යාප්ත ස්ථානීය සංඥා පද්ධතිය

14. ජලජ පද්ධතියක දක්නට ලැබෙන පහත ශාක අතරින් බැරලෝහ සංචිත වීම හේතුවෙන් ආහාරයට ගැනීමට නුසුදුසු වන ශාකයකි.
1. ලුණුවිල 2. බැකෝපා 3. නෙළුම් 4. දියගොටුකොළ

15. පැටවුන් බිහිකරන විසිතුරු මත්ස්‍යයෙකු නොවන්නේ,
1. ගප්පි 2. ප්ලේටි 3. එන්ජල් 4. මොලි

16. පහත රූපයේ දැක්වෙන මත්ස්‍යයාගේ වරල් වල පිහිටීමයි. ඒ අනුව A, B, C, D වරල් පිළිවෙළින් දැක්වෙන නිවැරදි පිළිතුර මින් කුමක්ද?




1. පෘෂ්ඨීය, ගුද, ළය, ශ්‍රෝණි හා වලිග වරල
2. ළය, ශ්‍රෝණි, ගුද, පෘෂ්ඨීය හා වලිග වරල
3. පෘෂ්ඨීය, ගුද, ළය, ශ්‍රෝණි හා පෘෂ්ඨීය වරල
4. ගුද, ළය, ශ්‍රෝණි, පෘෂ්ඨීය හා වලිග වරල

17. පහත සඳහන් මත්ස්‍ය විශේෂ ජීවත් වන පරිසරය අනුව නිවැරදිව ගැළපෙන පිළිතුර තෝරන්න.
1. කිවුල් දිය - ගිණිමහ 2. මිරිදිය - සමනල් මාළුවා
3. කරදිය - බුලත් හපයා 4. කිවුල් දිය - මොදා

18. සාම්ප්‍රදායික මත්ස්‍ය පරිරක්ෂණ ක්‍රමයකි,
1. ශීතනය 2. ටින් කිරීම 3. අධිශීතනය 4. වේලීම

19. මත්ස්‍යයෙකු පිහිනීමේදී ක්ෂණිකව වලන නවතා ගැනීම හෙවත් තිරිංගයක් ලෙස ක්‍රියා කරන වරල මින් කුමක් ද?
1. ශ්‍රෝණි වරල 2. ළය වරල 3. ගුද වරල 4. පෘෂ්ඨීය වරල





20. මත්ස්‍ය ආහාරයක අඩංගු විය යුතු පෝෂණ සංඝටක ආරෝහණ පිළිවෙලට දැක්වෙන පිලිතුර තෝරන්න.
1. විටමින්, ප්‍රෝටීන්,මේදය
2. විටමින්, මේදය, ප්‍රෝටීන්
3. මේදය, ප්‍රෝටීන්, විටමින්
4. මේදය, විටමින්, ප්‍රෝටීන්

21. මත්ස්‍ය අස්වනු නෙළීමේ දී අස්වනු වලට සිදුවන හානිය අවම වන ආම්පන්නය මින් කුමක්ද?
1. කරමල් දැල
2. ත්‍රිත්ව දැල
3. මරුවැල් පන්නය
4. ට්‍රෝල් දැල

22. කරදියෙහි පමණක් දක්නට ලැබෙන සත්ත්වයෙකි.
1. ඉස්සා
2. කකුළුවා
3. ගොළුබෙල්ලා
4. පතා මැඩියා

23. වෙළඳපොළ දී නැවුම් මත්ස්‍යයෙකු හඳුනා ගන්නේ,
1. රතු පාට ඇස් වලින් යුක්ත වීමෙන්.
2. කරමලය ලා රෝස පැහැති වීමෙන්.
3. ඇගිල්ලෙන් එබූ විට ඇතිවන සලකුණ ඉක්මනින් නැති වීමෙන්.
4. සෙවළ ස්ථරය කිරි පැහැති වීමෙන්

24. මත්ස්‍යයාගේ පෞච්ජ වරලේ හැඩය හා ඊට අදාල මත්ස්‍ය විශේෂය සමග ගැළපෙන පිළිතුර තෝරන්න.
1. කාපයන්
2. ට්‍රවුට්
3. මෝරුන්
4. බලයා

25. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකාව තුළ හමුවන ජලජ ශාක කිහිපයකි.
A- ලුණුවිල
B- සැල්වීනියා
C- දියගෝවා
ඉහත ශාක අතරින් ජලජ ආක්‍රමණික ශාක වන්නේ,
1. A සහ B
2. A සහ C
3. B සහ C
4. A, B සහ C

26. වතුර කකුළුවන් ලෙස හැඳින්වන්නේ,
1. කිවුල්දිය වෙසෙන කකුළුවන් ය.
2. මාංශය වැඩි කකුළුවන් ය.
3. මිරිදිය වෙසෙන කකුළුවන් ය.
4. බාහිර සැකිල්ල සන නොවූ කකුළුවන් ය.

27. පොකුණක ආවිලතාවය මැනීමට සුදුසු උපකරණය වන්නේ,
1. DO මීටරය
2. pH මීටරය
3. සෙකි තැටිය
4. උෂ්ණත්වමානය

28. අල්ලා ගත් මත්ස්‍ය අස්වනු පරිහරණයේදී ප්‍රථමයෙන් ඉවත් කරනු ලබන්නේ,
1. කරමල් හා වරල්
2. අභ්‍යන්තර ඉන්ද්‍රියයන් සහ කරමල්
3. වරල් හා කොරපොතු
4. කොරපොතු හා කරමල්

29. මත්ස්‍ය පොකුණක් සැකසීමට භූමියක් තෝරාගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
1. පහත් වගුරු බිමකි.
2. බෑවුම් බිමකි.
3. ජලය බැසයන බිමකි.
4. තැනිතලා බිමකි.

30. කඩොලාන ශාක සතු පොදු ලක්ෂණයක් නොවන්නේ,
1. පතනශීලි ස්වභාවය
2. මාංශල පත්‍ර තිබීම.
3. පත්‍ර වල කටු දැරීම
4. ජලාබුජතාවය





31. මත්ස්‍ය ටැංකියක වෙසෙන රෝගී තත්ත්වයක් පෙන්නුම් කල මසුන් කිහිප දෙනෙකුගේ එම තත්ත්වයට ලුණු මිශ්‍ර ජලයේ දමා විනාඩි කිහිපයක් තැබූ විට එම රෝග ලක්ෂණ නැති වී ගියේ ය. එම රෝග තත්ත්වයට හේතු වූ රෝග කාරකය.
1. දිලීරයකි.
2. බැක්ටීරියාවකි.
3. වයිරසයකි.
4. පරපෝෂිතයෙකි.

32. නිවැරදිව ගැළපෙන වරණය තෝරන්න.
1. මොයිනා - ප්‍රොටොසෝවා 2. ආටිමියා - ක්‍රස්ටේසියා
3. රොටිෆර් - නෙමටෝඩා 4. ටියුබිෆෙක්ස් - මොලුස්කා

33. ශ්‍රී ලංකාවේ ප්‍රධාන මත්ස්‍ය තොග වෙළඳ මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ,
1. හලාවත 2. මීගමුව 3. හම්බන්තොට 4.පැලියගොඩ


34. pH අගය අඩු කිරීම යන මූලධර්මය මත පදනම් වූ මත්ස්‍ය පරිරක්ෂණ ක්‍රමයකි.
1. දුම් ගැසිම 2. කරවල සෑදීම 3. ජාඩි දැමීම 4. උම්බලකඩ සෑදීම

35. ජලය මත පාවෙන ආහාර ගැනීම සඳහා අනුවර්තනය වූ මත්ස්‍යය මුඛයක් ඇති රූපය තෝරන්න

1. 
2. 
3. 
4. 

36. මත්ස්‍ය ආහාරයක වැඩිපුරම අන්තර්ගත විය යුතු පෝෂකය වන්නේ,
1. කාබෝහයිඩ්‍රේට් 2. මේදය යි. 3. ප්‍රෝටීන් ය. 4. විටමින් ය.


37. ජලජ ජීව සම්පත් කර්මාන්තයේ පැවැත්මට බලපාන කළමනාකරණ ක්‍රම සඳහා,




ලෙස පවතින කළමනාකරණ ක්‍රමය වන්නේ,
1. ප්‍රජා මූලික හවුල් කළමනාකරණය 2. බලාත්මක කළමනාකරණය
3. ප්‍රජා මූලික කළමනාකරණය 4. පරිසරය ආශ්‍රිත කළමනාකරණය

38. කුඩා වීදුරු ටැංකියක සිටින මත්ස්‍යයන්ට රෝග හට ගැනීම වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි,
1. අධික ලෙස ආහාර සැපයීම. 2. ජලයේ භාෂ්මිකතාවය වැඩි කිරීම.
3. ප්‍රශස්ත මත්ස්‍ය ගහනයක් පවත්වා ගැනීම. 4. ටැංකිය වාතනය කිරීම.

39. රූපයේ දැක්වෙන A හා B යන කොටස් අනුපිළිවෙලින් මත්ස්‍යයෙකුගේ,




1. ඩිම්බකෝෂය හා ආමාශය වේ.
2. වාතාශය හා ආමාශය වේ.
3. වකුගඩුව හා ඩිම්බකෝෂය වේ.
4. ආමාශය හා වාතාශය වේ.


40. පරිසරයට අවම හානියක් වන ධීවර කටයුත්තක් වන්නේ,
1. මසුන් ඇල්ලීමට ත්‍රිත්ව දැල් භාවිතය.
2. මසුන් ඇල්ලීමට තල්ලු දැල් භාවිතය.
3. පොකිරිස්සන් ඇල්ලීමට පතුලේ එලන දැල් භාවිතය.
4. කලපු ඉස්සන් ඇල්ලීමට කට්ටු දැල් භාවිතය.

Past Papers Wiki

## II පත්‍රය

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1) A. පහත රූප වලින් දැක්වෙන්නේ ජලජ ජීවීන් කිහිපදෙනෙකි.



A B C D

I. ඉහත ජීවීන් අතරින් අපෘෂ්ඨවංශී ජීවීන් දෙදෙනෙකු නම් කරන්න.
II. මෙම ජීවීන් අතරින්,
   a) මාංශ භක්ෂකයෙකු හා
   b) පෙරා බුදින්නෙකු නම් කරන්න.
III. D ජීවියා, ජීවත් වන ජලජ පරිසර පද්ධති දෙකක් නම් කරන්න.
IV. A ජීවියා සතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
V. D ජීවියාගේ ආර්ථික වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.
VI. විලෝපිකයන්ගෙන් ආරක්ෂා වීමට B ජීවියා සතු විශේෂ හැඩගැස්සීම් දෙකක් සඳහන් කරන්න.

B. මත්ස්‍ය අස්වනු පරිරක්ෂණ ක්‍රම රාශියක් ඇති අතර ඒවා මගින් මත්ස්‍ය අස්වනු වල ගුණාත්මකභාවය ආරක්ෂා වෙයි.
I. මත්ස්‍ය අස්වනු පරිරක්ෂණය කරන ප්‍රධාන මූලධර්ම දෙකක් සඳහන් කරන්න.
II. මත්ස්‍ය අස්වනු පරිරක්ෂණයේදී භාවිතා වන ශීතනය හා අධිශීතනයේ වෙනස්කම් දෙක බැගින් සඳහන් කරන්න.
III. කරවල සෑදීමේ ගැලීම් සටහන ලියා දක්වන්න.
IV. මත්ස්‍ය අස්වනු පරිරක්ෂණයේ වැදගත්කම් දෙකක් ලියා දක්වන්න.

2) ජලජ පැළෑටි ප්‍රචාරණයට විවිධ ක්‍රම පවතී.
I. ජලජ පැළෑටි ප්‍රචාරණය සඳහා යොදා ගන්නා අලිංගික ප්‍රචාරණ ක්‍රම තුනක් සඳහන් කරන්න.
II. ජලජ පැළෑටි ලෙස ප්‍රයෝජනවත් වන,
   a. කරදිය
   b. මිරිදිය ජලජ පැළෑටි දෙක බැගින් නම් කරන්න.
III. a. ජලජ පැළෑටි වල වැදගත්කම් තුනක් සඳහන් කරන්න.
   b. ජලජ පැළෑටි වලට හානි කරන පලිබෝධකයින් දෙදෙනෙකු නම් කරන්න.

3) විසිතුරු මසුන්ගේ ඉහළ ඉල්ලුම සඳහා එම මසුන්ගේ වරල් වල හැඩය හා වර්ණය බලපායි.
I. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.
II. විසිතුරු මත්ස්‍ය රූප සටහනක් ඇඳ සියලුම වරල් නම් කරන්න.
III. a) විසිතුරු මසුන්ට වැළඳෙන ආසාදිත රෝග දෙකක් ලියා දක්වන්න.
   b) එම රෝග වලක්වා ගැනීමට ගත හැකි පියවර දෙකක් ලියන්න.

4) මත්ස්‍ය සම්පත් නෙළීම සඳහා විවිධ ආම්පන්න හා යාත්‍රා භාවිතා කරන අතර ඒවාද විවිධ නිර්ණායක ඔස්සේ වර්ගීකරණය කරයි.
I. ශ්‍රී ලංකාවේ භාවිතා කරන වැල් ආම්පන්න වර්ග දෙකක් නම් කරන්න.
II. a) එම එක් ආම්පන්නයකින් මසුන් අල්ලා ගනු ලබන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.
   b) එම ආම්පන්නයෙන් නෙළා ගන්නා මත්ස්‍ය විශේෂ දෙකක් ලියන්න.
III. a) පාරම්පරික ධීවර යාත්‍රා හතරක් නම් කරන්න.
   b) පාරම්පරික ධීවර යාත්‍රා භාවිතයේ වාසි හතරක් සඳහන් කරන්න.

PAST PAPERS WIKI

5) මිනිස් ක්‍රියාකාරකම් මෙන්ම ස්වභාවික විපත් හේතුවෙන්ද ජලය පරිසර පද්ධති හායනයට ලක්විය හැක.


I. ජලජ පරිසර පද්ධති හායනයට හේතු විය හැකි ස්වාභාවික හේතු හතරක් සඳහන් කරන්න.

II. ස්වාභාවික ජලජ පරිසර පද්ධතියක දක්නට ලැබෙන පුරුක් හතරක ආහාර දාමයක් ලියා දක්වන්න.

III. a) ජලජ පද්ධතිවල පැවැත්මට හානි කරන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

b) ජලජ පද්ධතිය සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.

6) පහත රූපයේ දැක්වෙන්නේ ජලජ පරිසර පද්ධතියකි.




I. a) A, B හා C ස්ථර හඳුනාගෙන නම් කරන්න.

b) C ස්ථරයේ ජීවත් වන මසුන්ගේ දේහ හැඩය කුමක්ද?

II. a) මෙවැනි ජලජ පරිසර පද්ධතියක ජීවත් වන මත්ස්‍ය නොවන ජලජ සතුන් හතරක් සඳහන් කරන්න.

b) රූපයේ දක්වා ඇති ජලජ පද්ධතියේ පවතින ගැටලු දෙකක් සඳහන් කරන්න.

III. මෙම ජලජ පරිසර පද්ධතියේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

7) අගය එකතු කළ මත්ස්‍ය නිෂ්පාදනයන් වර්තමානයේ බහුලවම ජනප්‍රිය වී ඇත.

I. අගය එකතු කල මත්ස්‍ය නිෂ්පාදන හතරක් සඳහන් කරන්න.

II. අගය එකතු කළ මත්ස්‍ය නිෂ්පාදන වල වැදගත්කම් තුනක් විස්තර කරන්න.

III. a) ජලජ ජීව සම්පත් කර්මාන්තය ආශ්‍රිත ගැටලු දෙකක් සඳහන් කරන්න.

b) ඉන් එක ගැටලුවක් විසඳගන්නා ආකාරය විස්තර කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank